අයිස් හා හෙරොයින් ජාවාරමේ යෙදුණු බවට පැවසෙන පුද්ගලයින් තිදෙනෙකු ජනවාරි 02, 2024 දින අත්අඩංගුවට ගැනී ඇති බව ලංකාදීප පුවත්පත (ජනවාරි 04, 2024) වාර්තා කර සිටී. ඒ මෙලෙසිනි:

සිරස්තලය: "අයිස් කුඩු විකුණූ කතුන් 2 ක් එක්ක තිදෙනෙක් මාට්ටු" (අන්තර්ගතය: "අයිස් හා හෙරොයින් ජාවාරමේ යෙදුණු බව කියන අවුරුදු 21ක තරුණියක සහ අවුරුදු 48ක කාන්තාවක ඇතුළු තිදෙනෙකු...)

ඔබ සිතන පරිදි,

1) මෙම වරදට සැකපිට තිදෙනෙකු අත්අඩංගුවට ගෙන තිබේ නම්, සිරස්තලයේ සහ අන්තර්ගතයේ කාන්තාවන් දෙදෙනා සම්බන්ධයෙන් පමණක් ඉස්මතු කෙරී ඇත්තේ මන්ද? අත්අඩංගුවට පත් වූ තුන්වෙනි පුද්ගලයාගේ ස්ත්‍රී පුරුෂ භාවය මෙම පුවතට අදාළ නොවන්නේත්, කාන්තාවන් දෙදෙනාගේ ස්ත්‍රී පුරුෂ භාවය පමණක් මෙම පුවතට අදාළ වන්නේත් කුමන පදනමකින් ද?

2) එවැනි අදාළත්වයක් නොමැති නම්, "පුද්ගලයන් තිදෙනෙකු" හෝ "තුන් දෙනෙකු" අත්අඩංගුවට පත් වූයේ යැයි සඳහන් කිරීම වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

3) අප නැවත නැවතත් පෙන්වා දී ඇති පරිදි, මෙවැනි මාධ්‍ය භාවිතාවන් ඔස්සේ කාන්තාව පමණක් සෘණාත්මක සන්දර්භයන් තුළ ඉස්මතු කිරීම හේතුවෙන් කාන්තාව පොදුවේ කොන් කිරීමකට ලක් කෙරෙනා ආකල්පයක් තීව්‍ර නොවන්නේ ද?

